**ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

---

**1. මූල්‍ය ප්‍රකාශන.**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය.**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුළ ආයතන 5 කින් ස්ථාපිත සම්ප්‍රේෂණ කුළුණු 10 න් කුළුණු 08 ක් සඳහා 1993 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ලැබිය යුතු රු.237,000 ක මුදලක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) සභාව සතු ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ගෙවන ලද රු.19,429,055 ක් වූ මුදල රු.16,173,485ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වත්කම් රු.3,255,570 ක් අඩුවෙන් දක්වා තිබුණි

(ඇ) විගණනයට ඉදිරිපත් කළ ලේඛන අනුව 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ඇත්ගාල හා කුරුඳුවත්ත ක්‍රීඩාපිටිවල සංවර්ධනය වෙනුවෙන් පිළිවෙලින් රු.7,708,307ක් හා රු.11,509,118ක් වැයකර තිබුණද, ක්‍රීඩාපිටිවල වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2013 හා 2014 වර්ෂවලදී ලැබිය යුතු රු.536,750ක ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ඉ) 2010 සිට 2012 වර්ෂවලට අදාළව මාර්ග පලුදු කිරීම් වෙනුවෙන් අයකර ගන්නා ලද රු.1,099,245ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඊ) 2014 නොවැම්බර් 24 දින පැවති රිට් අංක33/13 ට අනුව ගෙවිය යුතු රු.7,500 ක නීතිඥ ගාස්තු වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අයවිය යුතු රු.222,705 ක දැන්වීම් ගාස්තු රු.61,000 ක් ලෙස සටහන් කිරීම නිසා වර්ෂයේ අතිරික්තය රු.161,705 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

නඩත්තු ආධාර හා ගෙවීම්වලට අදාළව විවිධ ණයහිමි ලේඛනය අනුව ශේෂය රු.1,154,745 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.1,294,735 ක් වුයෙන් රු.139,990 ක් වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.79,790,772 ක් වු අතර, එයින් විෂයයන් 04 ක අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්හි එකතුව රු.4,461,084 ක් වී තිබුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.85,926,500 ක් වු අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.23,809,209 ක් විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) රීති 59 - 66 | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ ආදායම් පරිපාලක විසින් සභා බල ප්‍රදේශය තුළ තිබෙන කර්මාන්ත ඇතුළු වෙළඳ ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණය කර නොතිබුණි. |
| (ii) රීති 218 | සභාව ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,728,674 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,449,862 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,278,812 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2 ආදායම් පරිපාලනය**

---

**2.2.1 ආදායම් රැස් කිරිම් කාර්ය සාධනය**

---

2014 ජනවාරි 01 දිනට පැවති හිඟ ආදායමෙන් වර්ෂය තුළ අයකිරිම් අනුව වරිපනම් බදු, අක්කර බදු, කුලී සහ ජල ගාස්තු අයවිමේ ප්‍රගතිය දුර්වල තත්ත්වයක පැවති අතර, එය සියයට 47 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

**2.2.2 වරිපනම් හා අක්කර බදු**

---

වරිපනම් බදු හා අක්කර බදුවලට අදාළව වර්ෂයේ බිල් කළ ආදායමින් අයකිරීමේ ප්‍රතිශතය සියයට 54 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.2,065,066 ක සමුච්චිත හිඟ ශේෂයක් පැවති අතර, එම මුදලින් අයකර තිබුණේ රු.772,150 ක් හෙවත් සියයට 37 ක මුදලක් පමණි. වර්ෂයේ බිල් කිරිම් රු.858,361 ක් වු අතර, එයින් රැස් කිරීම් රු.458,981ක් හෙවත් සියයට 53ක් පමණක් වී තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට මුළු සමුච්චිත හිඟය රු.1,756,578 ක් වු අතර, 2015 ජුනි 30 දින වන විට මෙම ශේෂයෙන් රු.1,684,513ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. තවද 2014 දෙසැම්බර් 31 දිනට පැවති හිඟයෙන් රු.205,532 ක මුදලක් රාජ්‍ය ආයතන වලින් අයවිය යුතු වරිපනම් විය.

**2.2.3 හිඟ කඩ කුලී**

---

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අයවිය යුතු හිඟ කඩ කුලී/බදු ආදායම රු.778,124 ක් විය.

(ආ) කුරුදුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 01 හා 34 කඩ කාමරවලින් දිගින් දිගටම කුලී හිඟ හිට පැවති අතර, 2015 ජුනි 30 දිනට එකතුව රු.207,272ක හිඟ ශේෂයක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 03 සහ අංක 13 කඩ කාමර දෙක වසා දමා තිබු අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අංක 03 කඩ කාමරයෙන් රු.142,200 ක් කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 19 කඩ කාමරයෙහි වර්ෂ 1 ½ ක කාලයකට මාළු වෙළඳසැලක් පවත්වා ගෙන යාම සඳහා මාසිකව රු.2,000 බැගින් කුලියට ලබා දී තිබුණු අතර, දඩ මුදල සමඟ 2014 දෙසැම්බර් 31 දිනට රු.39,800ක මුදලක් අයවිය යුතුව පැවතුණි.

**2.2.4 බදු කුලී**

---

(අ) 2007 වර්ෂයේ සිට බදු දී තිබුණු හිස් බිම් කට්ටි 05 සඳහා බදු ගිවිසුම් අත්සන් කර තිබුණේ 2010 වර්ෂයේ දී ය.

(ආ) පැරණි ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ල බදු දිමෙන් 2014 දෙසැම්බර් 31 ට රු.42,300 ක මුදලක් අයවිය යුතුව පැවතුණු අතර, එම මුදල 2015 ජුනි මස වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ගම්පොල උසාවියේ පවතින M 6656 නඩුවට අදාළව නඩු ගාස්තු වශයෙන් රු.5,000ක් 2013 සැප්තැම්බර් 11 දින ගෙවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
--------------------------------------

(අ) වර්ෂය තුළ ආරම්භ කර, නිම කළයුතු රු.10,350,000 ක වටිනාකමැති කර්මාන්ත 14 ක් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ අනවසර ඉදිකිරීම් 02 ක් ද, 2014 වර්ෂයේ අනවසර ඉදිකිරීම් 14 ක් සම්බන්ධයෙන් 2015 ජුලි 22 වන විටත් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 06 දිනැති අංක 1840 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් නිවේදනය අනුව ත්‍රිරෝද රථ ගාලක් යටතේ මුල්වරට ලියාපදිංචි කිරිමේදි රු.5,000 ක මුදලක් අයකළ යුතු වුවද, ලියාපදිංචි වී ඇති ත්‍රිරෝද රථ නැවැතුම්පල 06ක් තුළ ගාල් කරන ත්‍රිරෝද රථ ගණනය කර ලියාපදිංචි කර ගැනිමට කටයුතු කර නොතිබුණි. එසේම මේ සම්බන්ධව අතුරු ව්‍යවස්ථා සම්මත කර ගෙන ද නොතිබුණි.

(ඈ) ගම්පොල දිසා අධිකරණයේ නඩු අංක 50/06 මඟින් අයවිය යුතු රු.25,000 ක මුදල 2012 සිට 2015 ජුලි 24 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

(අ) 2011 වර්ෂයේදි සභා අරමුදලින් රු.384,090 ක් වැය කර ආරම්භ කර තිබූ ජීව වායු ඒකකය මසක පමණ කාලයක් ක්‍රියාත්මක තත්ත්වයේ තිබී අක්‍රිය වී තිබුණි. 2015 ජුලි මස දක්වාම යථා තත්ත්වයට පත් කර නොතිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ රු.100,000 ක මුදලක් වෙන් කර තිබුණද, එය අළුතවැඩියා කිරිමට කටයුතු නොකිරීම නිසා වෙන් කළ මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයට වර්ග අඩි 1496 කින් යුත් ගොඩනැගිල්ලක් 2011 වර්ෂයේ ලබාදී තිබුණු අතර, මේ සම්බන්ධයෙන් කිසිදු ලියවිල්ලක් ප්‍රාදේශිය සභාව සතුව නොතිබුණි. 2015 ජුලි මස වන විටත් කුලී අයකර ගැනිමටද කටයුතු කර නොතිබුණි.

3.3 නිශ්ක්‍රිය වත්කම්
-------------------

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2013 යටතේ මැදරට පළාත් පාලනයේ තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන ව්‍යාපෘතිය E - නැණ පියස වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්ගේ 2014 මාර්තු 05 දිනැති අංක සිපිසි/සිළල්සි/4/4/1/97 -II දරන ලිපිය පරිදි රු. 680,647 ක් වටිනා භාණ්ඩ ලබා දි තිබුණද, එම E - නැණ පියස ප්‍රවර්ධන ව්‍යාපෘතිය 2015 ජුලි මස වන විටත් ආරම්භ කර නොතිබුණු බැවින් රු.680,647ක් වටිනා වත්කම් නිශ්ක්‍රියව පැවතුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් විෂයයන් 05ක සියයට 10 සිට සියයට 42ක් දක්වාද, වියදම් විෂයයන් 05ක සියයට 37 සිට සියයට 61ක්

දක්වා විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛන ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට තෘතික මට්ටමේ පුරප්පාඩුවක්ද ද්විතියික මට්ටමේ පුරප්පාඩු 09 ක් හා ප්‍රාථමික සේවයේ තනතුරු එකක්ද පැවති නමුත්, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ප්‍රාථමික සේවයේ තනතුරු 04 ක අතිරික්ත සේවකයින් 06 දෙනෙකු අනුමැතියකින් තොරව රඳවා ගෙන තිබුණි.

**5. පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.
(ආ) අයවැය පාලනය.
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය